# මා ගිය විනෝද චාරිකාව



චමල්කා නෙතායා ආරියතිලක

# මා ගිය විනෝද චාරිකාව

චමල්කා නෙතායා ආරියතිලක

5 වසර B

මහමායා බාලිකා මහා විදුහල

ISBN අංකය - 978-624-208-467-1

කතෘගේ වෙනත් කෘති

කවදාවත් බොරු කියන්න හොඳ නෑ - 2024

## පිදුම....

ආදරයෙන්

මා

හැදූ වැඩූ


මාගේ

දෙමාපියන්ට...

මාගේ පොත

ආදරයෙන්

පුදන්නම්...



# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

උදෑසන ඉර මාමා අපේ ගෙදර දිහා බලාගෙන ඉන්නවා මම දැක්කා. ”ඉර මාමේ මම මාමටත් කලින් නැගිට්ටා” ඉර මාමා හිනාවුනා විතරයි. කුරුළු රංචු පිටින් කෑ ගහනවා.



උදෑසන ඉර මාමා අපේ ගෙදර දිහා බලාගෙන ඉන්නවා මම දැක්කා. "ඉර මාමේ මම මාමටත් කලින් නැගිට්ටා" ඉර මාමා හිනාවුනා විතරයි. කුරුළු රංචු පිටින් කෑ ගහනවා.

"මොකද අනේ කෑ ගහන්නේ..." කුරුළු පැට-වුන්ගෙන් මම ඇහුවට උන්ට නම් ගානක්වත් නැහැ. තොර තෝන්චියක් නැතුව කෑ ගහනවා.

"හෙට මම ගමනක් යනවා..." මම කෑ ගහලා කුරුල්ලන්ට කිව්වා.

"හෙට උදේ ඔයාලා එද්දි මම නෑ... ඉර මාමටත් පියඹලා ගිහින් කියන්න." මම නැවත කුරුල්ලන්ට කිව්වා. කෑ ගසමින් සිටි කුරුළු රංචුව එකපාරටම පියඹලා ගියා. හරියට ඉර මාමට පණිවිඩය කියන්න වගේ.

මගේ සීයගේ ස්කූටරේ යන්න මම හරි ආසයි. මම වැඩිපුරම ඉස්කෝලේ යන්නේ සීයත් එක්ක. මම සීයත් එක්ක ස්කූටරේ නැගලා පාසැලට ගියේ හරි සතුටින්. ඒ හෙට අපේ ඉස්කෝලෙන් යන විනෝද චාරිකාව ගැන අපේ පංතිභාර ගුරුතුමිය විස්තර කියන නිසා.



සීයා පාසැලේ ප්‍රධාන ගේට්ටුව අසලින් මාව ඇරලවා ගියා. මගේ යාළුවොත් එක්ක මම පංතියට ගියේ මොකද්දෝ හිත පිරිච්ච සතුටක් එක්ක. පාසැල ආරම්භ වන සීනුව නාද වුනා. හැමෝම පන්සිල් ගැනීමෙන් පස්සේ පංති වල ඉගෙනගන්නා කටයුතු ආරම්භ කළා.

අපේ පංතිභාර ගුරුතුමිය පංතියට එනකොට අපි හැමෝම නැගිටලා ආචාර කළේ වෙනදටත් වැඩිය උනන්දුවෙන්. මම වගේම අනෙක් යාළුවොත් සතුටින් බව මට තේරුණා. ගුරුතුමී පාඩම උගන්-වන්න පටන් ගත්තා. ඒත් හැමෝම සන්සුන්ව ඉගෙන ගන්නා බවක් පේන්නෙ නෑ. ගුරුතුමී කාල පරිච්ඡේදය අවසන් හෙයින් පංතියෙන් පිටවී ගියේ නැවත පැමිණෙන පොරොන්දුව මතයි.

හැම යාලුවෙක්ගෙම මුහුණ මැළවී යන බව මම දුටුවත් මගෙත් එසේම බව මට තේරුණා. තවත් කාලච්ඡේදයක් ආරම්භ වුනා. තවත් ගුරුවරයෙක් ආවා. අපිට මොනවදෝ උගන්වනවා. කිසිකෙනෙක් අවධානය නැහැ. ඔහේ බලාගෙන ඉන්නවා. මටත් හරිම. ඔලුව කැක්කුමයි... නිදිමතත් වගේ. මම ඔලුව ටිකක් මේසය උඩ තියාගත්තේ ඔලුව බර ගතිය නිසාමයි.

උදේ පාන්දර වුනාට කළුවරයි. අම්මා මගේ කොන්ඩය ගෙතුවා වෙනදටත් වඩා ලස්සනට. අත්තම්මා රසට බත් උයලා කෙසෙල් කොළේ ඔතලා මට බත් පාර්සලයක් දික් කළේ හරි සතුටෙන්.

”පරෙස්සමින් ගිහින් එන්න ඕනෙ” අප්පච්චි ඔලුව අතගාල කිව්වා. වෙනදා වගේම සීයත් එක්ක ස්කූටරේට ගොඩ වුනේ ඉස්කෝලෙට යන්න. අම්මා මගේ බෑග් එක ගෙනත් දුන්නා.

මම ඉස්කෝලෙට යනකොට යාළුවෝ බස් එකට නැගලා. මමත් සීයට සමුදීලා බස් එකට නැග්ගේ යාළුවොත් එක්ක විනෝද චාරිකාව යන්න. ඔන්න අපේ බස් එක යන්න පිටත් වුනා. අපි සිංදු කියනවා. නටනවා. හිනා වෙනවා. පුදුම සද්දයක්. හරි සතුටුයි. බස් එකේ රියදුරු මාමත් වේගෙන් හැටට හැටේ යනවා. අපිව එහාට විසිවෙනවා. මෙහාට විසිවෙනවා. ඒ පාර නම් මාමා ගොඩක් වේගෙන් යනව වගේ. එක පාරටම රියදුරු මාමා වේගය වැඩි කළා. මම හිටියේ හිටගෙන අත්පුඩි ගසමින්. මාව විසි වෙලා ගියා. මටත් හිතාගන්න බැරිවිදියට බස් එකේ ජනේලයෙන් විසිවුනා. මාව ගොඩක් ඈතට විසි වුනා.

ඒ පාර මාව උඩට යනවා. කවුදෝ අහසට අදිනවා වගේ. මම උඩ බැලුවා. මගේ අත් දෙකෙන් කුරුල්ලෝ ගොඩක් ඇදගෙන යනවා.

"අනේ... මේ... මම කොහෙද?" මම කෑගහුවා කවුරුත් පේන්න නෑ. අහසේ තියෙන පුළුන් වලාකුළු විතරයි. "මාව කොහෙද ඇදගෙන යන්නේ?" මම අඩ අඩා ඇහුවා. කුරුල්ලෝ උත්තර දුන්නෙ නෑ. ටික වෙලාවකින් මට දැනුනා මාව පා වෙනවා වගේ. මම වට පිට බැලුවා. කුරුල්ලෝ මාව අතඇරලා. එයාලත් පා වෙනවා. මම බිම බැලුවා. හරිම ලස්සනයි. ගිනිපෙට්ටි තරම් ගොඩනැගිලි, කොළ පාටයි, නිල් පාට ඉරි වගේ ගංගා, කඳු මුදුන් හරිම ලස්සනයි. මට බය නැතිවුනා. කුරුල්ලෝ මට කතා කරන්න පටන් ගත්තා.

"ඔයා විනෝද චාරිකාවක් යනවා කිව්වනේ"

"ඉතින් අපි ඔයාව විනෝද චාරිකාව එක්කන් ආවා" කුරුළු පැටියෙක් කිව්වා.

”ඉර මාමා තමයි ඔයාව එක්ක එන්න කිව්වේ”

”අනේ හරිම ලස්සනයි”



"දුව...." ඉර මාමගේ හඬ ඇහුනා.

"මට ඔයා ළඟට එන්න බැහැනේ... ඒ නිසා මම ඔයා දිහා බලාගෙන ඉන්නවා..."

"ඉර මාමේ පල්ලෙහා හරි ලස්සනයි. අර... අර තියෙන්නේ.. අපේ ගෙදරද?"

"හා... හා... ගොඩක් පහළට යන්න එපා" කුරුල්ලෝ කෑ ගැහුවා.

"අර... අර... මගේ යාළුවෝ... මුහුදේ සෙල්ලම් කරනවා... අනේ එයාලට පේන්න මම උඩින් පා වෙනවා"

මම ඉක්මනට පහළට පා වෙන්න ගියා විතරයි. මට දැනුනා මාව කැරකි කැරකි පහළට වැටෙනවා. "අයියෝ... අම්මේ... අනේ අම්මේ මාව බේරගන්න... අනේ අම්මේ..." මම කෑ ගැහුවා. ඒත් කවුරුත් පේන්න නෑ. වළාකුළු කැරකෙනවා මම දැක්කා.

"චමල්කා... චමල්කා..." ගුරුතුමියගේ හඬින් මම ගැස්සුනා. සියළු දෙනාම මගේ දිහා බලාගෙන ඉන්නවා.

"මොකද ළමයෝ දවල් හීන දැක්කද?"

"අපි ට්‍රිප් එක ගියේ නැද්ද?" මම ඇහුවා.

"හෙටනේ යන්නේ..." ගුරුතුමී කිව්වා.

මට එතකොටයි තේරුනේ මම විනෝද චාරිකාව හීනෙන් ගිහින් තියෙන බව. ඒත් ඒ විනෝද චාරිකාවට නම් මම හරිම ආසයි. ඒ වගේම බයයි. මට ඇත්තටම යන්න තිබුන නම් කියල හිතුනා.

නිමි...



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි  බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා  වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ  ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ  එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ  ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත්  සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන්  වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන්  ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

**චමල්කා නෙතායා ආරියතිලක**

**5 වසර B**

**මහාමායා බාලිකා මහා විදුහල**

**ISBN අංකය - 978-624-208-467-1**